# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | |
|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 |
| ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) |
| වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | |
|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 917 / 2024 |
| ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 31/05/2024<br>පැය 1520 |

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.05.30 වන දින උදෑසන කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ ආර්.බී වත්ත ප්‍රදේශයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 310 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන මාලිාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තිස්සමහාරාමය පොලිස් ස්ථානය.**

2024.05.30 වන දින දහවල් කාලයේ තිස්සමහාරාම පොලිස් වසමේ යකඩ පාලම අසල ප්‍රදේශයේදී තිස්සමහාරාම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 52 ක් මිලිග්‍රෑම් 800 ක් හා හෙරොයින් ග්‍රෑම් 12 මිලි ග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන සිරිබෝපුර, හම්බන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිස්සමහාරාම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **තීරු බදු රහිතව නිතී විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.30 වන දින රාත්‍රී කාලයේ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කෙසෙල්වත්ත පොලිස් වසමේ බ්‍රැන්ඩියාවත්ත මාර්ගය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීතී විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 20,000ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන අලුත්කඩේ ප්‍රදේශයේ පදිංචිකරු.**

කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **විදේශීය රටක නිෂ්පාදනය කරන ලද ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මරදන්කඩවල පොලිස් ස්ථානය.**

2024.05.30 වන දින උදෑසන කාලයේ මරදන්කඩවල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන මරදන්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදන්කඩවල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **නාඳුනන මල සිරුරු දෙකක් හමුවීම - තෙල්දෙණිය පොලිස් ස්ථානය.**

2024.05.30 වන දින දහවල් කාලයේ තෙල්දෙණිය පොලිස් වසමේ අඹකොටේටේ ප්‍රදේශයේ වික්ටෝරියා ජලාශය තුළ නාඳුනන පිරිමි මල සිරුරු දෙකක් ඇති බවට තෙල්දෙණිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මරණකරුවන්ගේ අනන්‍යාතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර එක් අයෙක් අවුරුදු 20ත් 25ත් අතර හා අනෙක් පුද්ගලයා අවුරුදු 30ත් 35ත් අතර වයස් වල පසු වන පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු වේ.
**මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීර මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.**
තෙලදෙණිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**